# කලා හා වාස්තුවිද්‍යාත්මක අංගයක් වශයෙන් මුරගලෙහි විකාශය හා සංකේත භාවිතය (අභයගිරි පරිශ්‍රය ඇසුරින්)

**ඩී.එම්.ඩී.එල්. කුමාර**
අභයගිරි විහාර ව්‍යාපෘතිය, මධ්‍යම සංස්කෘතික අරමුදල, අනුරාධපුරය
laksirimax007@gmail.com

ප්‍රමුඛ පද: මුරගල, අභයගිරිය, ගල් පුවරුව

**හැඳින්වීම**

ක්‍රිස්තු පූර්ව පළමුවන සියවසේ වළගම්බා රජු දවස ආරම්භ වන අභයගිරිය එකොළොස්වන සියවස තෙක් විකාශය විය. මෙම පරිශ්‍රය තුළ වාස්තු විද්‍යාත්මක අංග විශාල ප්‍රමාණයක් හඳුනා ගත හැකි අතර ඉන් එකකි මුරගල. සඳකඩපහණ දෙපස, කොරවක් ගල පාමුල ගොඩනැගිල්ලේ හා දොරටුවේ ප්‍රමාණයට ගැළපෙන අයුරින් සිරස් ශෛලස්ථම්භ යුගලයක හැඩයට මුරගල නිර්මාණය කර ඇත. ආරක්ෂක ගල්, දොරටුපාල ගල්, සීමා ස්ථම්භය ආදී නම් ද මෙය හැඳින්වීමට භාවිත වේ (ගොඩකුඹුර 1982:07). කොරවක්ගල ලිස්සා ඒම වැළැක්වීම සඳහා යොදන ලද කුඤ්ඤයක් ලෙස මුරගල භාවිත වූ බව ආචාර්ය චාල්ස් ගොඩකුඹුර පවසයි (1982:07). මුරගල දොරටු සැලැස්මේ අලංකාරය හා අංග සම්පූර්ණත්වය සඳහා අවශ්‍ය අංගයක් ලෙස යොදන ලද්දක් බව මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ පවසයි (1995:23). අභයගිරි පරිශ්‍රයේ දී මුරගලෙහි ආරම්භයේ සිට එහි ස්වර්ණමය අවධිය තෙක් මුරගල නිර්මාණය වූ ආකාරය පිළිබඳ නිවැරදි පුරාවිද්‍යාත්මක සාධක අනාවරණය කරගත හැකි ද යන්න මෙම පර්යේෂණයේ ගැටලුවයි. අභයගිරි පරිශ්‍රයෙන් හමුවන මුරගල් පිළිබඳ ව පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කිරීම අරමුණ වූ අතර එහි දී මුරගලෙහි විකාශය හා සංකේත භාවිතය පිළිබඳ ව අධ්‍යයනය කිරීම සිදු කරනු ලැබේ.

**ක්‍රමවේදය**

සාහිත්‍ය මූලාශ්‍ර පරිශීලනය, ක්ෂේත්‍ර අධ්‍යයනය, සම්මුඛ සාකච්ඡා මඟින් ලබා ගන්නා දත්ත ඇසුරින් ගුණාත්මක විශ්ලේෂණය

**විමර්ශනය**

අභයගිරි පරිශ්‍රයෙන් හමුවන මුරගල් කැටයම් රහිත හා කැටයම් සහිත වශයෙන් හඳුනා ගත හැකිය. කැටයම් රහිත මුරගලෙහි පළමුවන අවස්ථාව දෙකොන් හැඩ ගැන් වූ හතරැස් ගල් පුවරුවයි. එහි දෙවන අවස්ථාවේ දී ගල් පුවරුවෙහි මුදුනේ මැද උන්නත සහිත ව නිර්මාණය කර ඇත.

කැටයම් සහිත මුරගලෙහි පළමු අවස්ථාව පුන්කලස සහිත මුරගලයි. මෙම මුරගලෙහි මුදුනේ මැද උන්නත සහිත ව නිර්මාණය කර ඇත. සෞභාග්‍යය, සශ්‍රීකත්වය, ජයග්‍රහණය නිරූපණය කිරීම සඳහා පුන්කලස යොදාගන්නට ඇත. පුන්කලස මංගල සංකේත වලින් එකකි. බලාපොරොත්තුව, ප්‍රසන්නතාව, අභ්‍යන්තරික සැනසීම වැනි හැඟීම් ජනිත කරවීම සඳහා ද, අධ්‍යාත්මික වූත්, බාහිර වූත් ආරක්ෂාව ජනිත කිරීම සඳහා පුන්කලස මුරගලට යොදා ගන්නට ඇත.

අභයගිරි පරිශ්‍රයෙන් හමුවන කැටයම් සහිත මුරගලෙහි දෙවන අවස්ථාව වාමන රූප එක්වීම හඳුනා ගත හැකිය. එම මුරගල්වල කුවේරයාගේ සමුද්‍රගත නිධන් රකින ශංඛ හා පද්ම නැමති බහිරවයන්ගේ රූප කෙටීම දක්නට ලැබේ. අභයගිරි ස්තූපයෙහි දකුණු දොරටුව අසල මෙවැනි මුරගල් දක්නට ලැබෙන අතර ස්තූපයෙහි ආරක්ෂාව සංඛ පද්ම දෙදෙනාට භාර දීම සංකේතවත් කිරීම සඳහා මෙය නිර්මාණ කළ බව සිතිය හැකිය. ධර්මය නැමති නිධානය ආරක්ෂා කිරීම යන්න ද සංකේතවත් විය හැකිය. ඉන්දියානු ආභාෂය අනුව මෙම සංඛ හා පද්ම බහිරව මුරගල් මෙරට ස්මාරක සඳහා යොදා ගනු ලැබීය (පරණවිතාන 1995:62). ඉන්දියානු මුලාශ්‍රයන්ට අනුව සංඛ හා පද්ම නිධි බහිරවයන්ගේ අත්වල නිර්මාණය වී ඇතත් අභයගිරි ස්තූපයෙහි දකුණු දොරටුවෙහි මුරගල්වලට අනුව සංඛ පද්ම නිධි හිස මත නිර්මාණය කර ඇත (පරණවිතාන 1995:62). සංඛ හා පද්ම බහිරව මුරගල් දේශීයත්වයට පත් කිරීම මෙමගින් අපේක්ෂා කරන්නට ඇති බව සිතිය හැකිය.

අභයගිරියෙන් හමුවන මුරගල් අතර තවත් එක් මුරගල් වර්ගයක් ලෙස නා රුව සහිත මුරගල හඳුන්වා දිය හැකිය. අභයගිරියට අයත් කුට්ටම් පොකුණෙහි මෙම මුරගල දක්නට ලැබේ. මුරගලෙහි ඉහළ කොටසෙහි මකර රූප දෙකක් කැටයම් කර ඇති අතර මැද කොටසෙහි පෙණ පහක් සහිත දරණ ගසා සිටින නාග රූපය නිර්මාණය කර ඇත. සෞභාග්‍යය, සශ්‍රීකත්වය ආරක්ෂාව වැනි සිතුවිලි විද්‍යමාන කිරීම සඳහා මෙය නිර්මාණය කරන්නට ඇතැයි සිතිය හැකිය. පැරණි සංස්කෘතිය තුළ නාගයා හා ජලය අතර අවිච්ඡින්න වූ සබඳතාවක් පැවතීම කරන කොට ගෙන නාගරාජ මුරගල එම ස්ථානයේ නිර්මාණ කරන්නට ඇත. චාල්ස් ගොඩකුඹුර මේ පිළිබඳ ව අධ්‍යයනය කර මෙය මුරගල් ගණයට ගත නොහැකි බව පවසයි (1982:07).

මුරගල සංකීර්ණත්වයකට පත් වෙමින් සතරවරම් දෙවියන්ගේ රූප මුරගලට එක්වීම අභයගිරි මුරගල් තුළින් හඳුනා ගත හැකිය. ධෘතරාෂ්ට්‍ර, විරූඪ, විරූපාක්‍ෂ, වෛශ්‍රවණ, යන සතරවරම් දෙවිවරු බෞද්ධ ආරක්‍ෂණ දෙවිවරුන් ලෙස ස්තූපයන්හි, ධාතු ගර්භවල, වාහල්කඩ දෙපස, සතර පැත්තේ නිර්මාණය කර ඇත. මෙය ක්‍රමයෙන් මුරගල් සඳහා ද යොදාගත්

බව මෙම මුරගල්වලින් තීරණය කළ හැකිය. මෙම මුරගල්වල හිස වටා නාග පෙණ දක්වා තිබීම නිසා ඇතැම් පිරිස් මේවා නාග රාජයන් ලෙස අර්ථ දැක්වීම දෝෂ සහිත බව පෙනේ. හිස වටා නාග පෙණ දැක්වීම මඟින් සතරවරම් දෙවිවරුන්ගේ ප්‍රභවය සංකේතවත් කරන්නට ඇතැයි සිතිය හැකි ය (වික්‍රමගමගේ 1995:26). සතරවරම් දෙවිවරුන් එකම ආකාරයෙන් නිරූපණය කිරීම නිසා එක් එක් දිසාවට අධිපති මහාරාජ දෙවිවරුන් හඳුනාගැනීම දුෂ්කර වූ බැවින් මුරගලේ එක් පැත්තක දිශාව නියෝජනය කරන සිවුපා රූපය යෙදීම සිදු කරන්නට ඇත. අනෝතත්ත විල පිළිබඳ පාලි අට්ඨ කථාවල එන සංකල්පයක් අනුව යමින් නිර්මාණකරුවා නැගෙනහිර, දකුණ, බටහිර හා උතුර යන දොරටුවල පිළිවෙළින් ඇතා, ගවයා, අශ්වයා, සිංහයා යොදා ඇත (වික්‍රමගමගේ 1995:26). අභයගිරි උත්තර මූලයේ ධාතු මන්දිරයේ ද, රත්නප්‍රාසාදයේ ද නැගෙනහිර දොරටුවෙන් ඇත් රූපය දක්නට ලැබේ. කපාරමූලයේ ගොඩනැගිල්ලක උතුරු දොරටුවෙන් හමු වූ මුරගලක සිංහ රූපයක් දක්නට ඇත. මෙසේ මුලින්ම තිබූ තැන්වලම තවමත් ඇති මුරගල්වල නියම දිශාවට අයත් සිවුපා රූප දක්වා ඇති බව සඳහන් කළ යුතුය. මූලාරම්භයේ සිට මුරගල අලංකාර කිරීම සඳහා යොදාගත් සැරසිලි අංග සියල්ල එකතු කොට මේ මුරගල නිර්මාණය වී ඇත. දිසා පාලන දෙවිවරුන්ගේ රූප පමණක් නොව ඔවුන්ගේ භාර්යාවන්ගේ ද රූප සහිත මුරගල් නිර්මාණය වූ බවට අභයගිරි මහසෙන් මාළිගාව නමින් ජන වහරේ ඇති පංචාවාසයට නැගෙනහිරින් පිවිසෙන දොරටුවෙහි ඇති ධෘතරාෂ්ඨ සිය බිරිඳ සමඟ පෙනී සිටින මුරගල සාක්ෂි දරයි. මෙහි ප්‍රමුඛත්වය පුරුෂයාට වන අතර ස්ත්‍රී රුව කුඩා කර නිර්මාණය කර ඇත. පීතෘ මූලික සමාජයේ බලපෑම මත මෙසේ සිදු වූවා විය හැකිය. කපාරාමූලයෙන් හමුවන තවත් දිසා පාලන මුරගලක හා රත්නප්‍රාසාද මුරගලෙහි ද දේව රූපයට පහළින් බහිරව රූපයක් ද නිර්මාණ වී ඇත. උත්තර මූලයෙහි ධාතු මන්දිර මුරගලෙහි දේව රූපයට පහළින් බහිරව රූප දෙකක් දෙපස දක්නට ලැබේ. දෙවියන්ගේ සේවක පිරිස් බවට බහිරවයන් පත් කළ ස්වභාවයක් මින් නිරූපනය වේ.

මුරගල් අතුරින් ශ්‍රී ලංකාවේ කලාත්මක ම මුරගල අභයගිරියේ රත්නප්‍රාසාද මුරගලයි. මෙහි ආරුක්කුව මුදුනේ මැද දෙපසට මුළු දල්වාගත් මකර හිස් දෙකකි. පහළින් ද උඩට මුළු දල්වාගත් මකර හිස් දෙකක් දෙපසින් ඇත. ඒ අතර පෙම්වතුන් හා යෝධයන් මකර කටට ඇදී යන අන්දම පෙන්වයි. මෙහි මකරාගෙන් කාලය සංකේතවත් කරයි. කාලය විසින් භූතයන් කා දමන බව මහායාන ඉගැන්වීමයි. මෙහි ඇති දේව රූපයේ ආභරණ සියුම් කැටයමින් යුක්තව නිර්මාණය කර ඇත.

රත්නප්‍රාසාද මුරගලට තරමක් නෑ කම් කියන මුරගලක් ද අභයගිරි

කපාරමූලයෙහි පොකුණකින් සොයා ගෙන ඇත. මෙහි නැගිට සිටින සිංහ රූප දෙකක් තොරණට යටින් දක්වා ඇත. දකුණු පසින් ඉදිරිය බලා සිටින සිංහයකු වන අතර එම සිංහයාට ඉහළින් කණුවක් මත ගව රූප යුගලයක් වේ.

**නිගමනය**

මුරගල, කලාව ආනන්දයෙන් ප්‍රඥාව කරා මිනිසුන් රැගෙන ගිය බවට කදිම නිදසුනකි. එය පැරණි කැටයම් කලාවේ අභිමානය, විශිෂ්ටත්වය නිහඬ ව ප්‍රකාශ කරයි. අභයගිරි පරිශ්‍රයේ දී මුරගලෙහි ආරම්භයේ සිට එහි ස්වර්ණමය අවධිය තෙක් මුරගල නිර්මාණය වූ ආකාරය පිළිබඳ නිවැරදි පුරාවිද්‍යාත්මක සාධක අනාවරණය කරගත හැකි ය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


ගොඩකුඹුර, චාල්ස්, මුරගල්, 1982, පුරාවිද්‍යා දෙපාර්තුමේන්තුව කොළඹ.

පරණවිතාන, සෙනරත්, ලංකාවේ ස්තූපය, 1995, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තුමේන්තුව

වික්‍රමගමගේ, චන්ද්‍රා, පැරණි ගොඩනැගිලි දොරටු, 1995, තරංජි ප්‍රින්ටර්ස් මහරගම.